

# රෝසිගේ උදව්ව

රිසදී මෙතුනිමා යටවර

# රෝසිගේ උදව්ව

## රිසදි මෙතුනිමා යටවර

කතෘ

පළමු දිගහැරීම

මහ/මහමායා බාලිකා විද්‍යාලය

**3-B**

**2026.05.10**

**ISBN – 978624211149-0**

# පිදුම

මම නිර්මාණය කළ

මාගේ පලමු කතා පොත

අම්මා,අප්පච්චී ,

අයියා හා අක්කා නමින්

පුදමි



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය.දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරට උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා  කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. ඒ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මග පෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධිර

විදුහල්පති

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

## <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර එය පොත්පත් හා සාහිත්‍යය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වෙයි. සිසු දරුවන්ගේ දක්ෂතා නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලි ය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනාසාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි.

එමෙන්ම මෙවැනි උත්සාහයක් තුළින්අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය ගුරු මණ්ඩලය සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි .

සරත් බී.එස්.අබේකෝන්

ආණ්ඩුකාරවර මධ්‍යම පළාත සම්මානිත මහාචාර්ය

පේරාදෙණිය විශ්ව විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ ශිෂ්‍යා දියණිවරු, සෙසු පාසල් වල ශිෂ්‍ය දූ පුතුන් සහ සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය ගුණාත්මක සහ සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිට එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී පාසල් පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථ කරණ වැඩසටහන හේතු පාදක වෙයි. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල

දියවඩන නිලමේ


ශ්‍රී දළදා මාලිගාව



රෝසි දවසක් අයියා සහ අක්කා සමග සෙල්ලම් කරන්න වත්ත පහල ට ගියා.

රෝසි කිව්වා

අපි අද ඇස් බැන්දුම් සෙල්ලම කරමු. කියල



ටික වේලාවකින් තද සුලගක් ආවා.රෝසි ට නම් බය හිතුණා.ඒ වේලාවෙදි ම අම්මා කතා කරන හඬ ඇහුනා.

"දැන් සෙල්ලම් කළා ඇති  හැමෝම ඇතුලට එන්න"

" හරි හරි අපි ඉක්මනට එන්නම් " අක්කා කෑ ගසා කිවුවා.

අපි ගේ පැත්තට යන්න යනකොට ලේන් පැටියෙක් ටිං...ටිං...ගා කෑ ගසන ශබ්දයක ඇසුණා.අපි තුන්දෙනා ම ආපසු ඒ පැත්තට  ගියා.







අනේ ..අර බලන්නකෝ  ලේන් කූඩුවක් බිම වැටිලා..." අයියා කිව්වා.

"අනේ ඇත්තමයි...අක්කේ, අයියේ මේ බලන්න ලේන් පැටියෙක් " මට කෑ ගැසුණා.

අයියා ලේන් පැටියව අතට ගත්තා " අපි මෙයාව ගෙදර අරන් යමු.." අයියා කිවුවා.රෝසි ඒ අතරේ ඉක්මනට දුවගෙන ගිහින් මේ ගැන අම්මාට කිවුවා


අම්මාත් රෝසිත් එක්කම ඒ පැත්තට යනකොට අයියා සහ අක්කා ලේන් පැටියත් අරන් ගෙදරට ම ආවා.





අනේ පවු චූටි ලේන් පැටියෙක්...එයාට  බඩගිනි වෙලා වෙන්න ඇති කෑ ගහන්නේ...රෝසි කිවුවා.


අක්කා ඉක්මනට ම කිරි එකක් හදාගෙන ආවා.



දැන් අපි කොහොමද මෙයාට කිරි පොවන්නේ?

" ආ මම දන්නවා."

එහෙම කිව්ව අයියා පහන් තිරයක් අරන් ආවා.



පහන් තිරය පොගවලා එයාගේ චූටි කටෙන් තිබ්බා,


ආනේ එයා කිරි බොනවා.රෝසි උඩ පැන්නා

එතකොටම වත්ත පහලින් ලේන් අම්මා ටිං..ටිං..ගාන සද්දෙ ඇහුණා.

ලේන් අම්මා පැටියව හොයනවා.අපි දැන් මොකද කරන්නේ?

අපි එයාව අම්මා ලගට ගිහින් දෙමු.





අපි හැමෝම වත්ත පහලට ගිහින් ලේන් පැටියව ගහ මුලින් තියලා ඈතට වෙලා බලා හිටියා.

ලේන් අම්මා ඉක්මනට ගහෙන් බැහැලා ඇවිත් එයාගේ කටට පැටියව අරන් යන්න ගියා.





<u>පසුවදන</u>

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි.නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි.

ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත්පත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ නූතන පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකි නිසාය. තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේමමාලා උපහාර E ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන් විදුහල්පතිනිය , ගුරුභවතුන් , දෙමාපියන් , ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද , දියවඩන නිලමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්‍ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ )

ISBN – 978624211149-0